**පොතුවිල් ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 14 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදාළ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පොතුවිල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කාලපරිච්ඡේදය සඳහා විවිධ ආයතනවලින් පරිත්‍යාග ලෙස ලැබී සභාවේ නමට අයිතිය මාරු කරනු ලැබූ වාහන 10 ක්, ට්‍රැක්ටර් 05 ක්, ට්‍රේලර් 09 ක් සහ බවුසර් ආදියෙහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2011 සිට 2016 දක්වා කාලපරිච්ඡේදවල යුනොප්ස්, අබාන්ස් සහ නෙල්සිප් ආයතනවලින් ලබාදී තිබූ පිළිවෙලින් වායුසමීකරණ 03 ක්, රූපවාහිනි යන්ත්‍ර 02 ක් සහ ශීතකරණයෙහි වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.2 ලේඛනමය සාක්ෂි නොවීම

සභාව විසින් ඉදිරිපත් කරනු ලැබූ 2017 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 1992 වර්ෂය අනුව ගිණුම් ශේෂ වශයෙන් ඉදිරියට ගෙන එනු ලැබූ එකතුව රු.4,736,234 කට අදාල විෂයයන් 05 ක විස්තරාත්මක ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතියේ I පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | - | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් තැබීම ආදිය නිලධාරීන් තිදෙනෙකුට පරිපාලනමය වශයෙන් පවරා දී තිබුණත්, ඔවුන්ගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය | 19,697 | සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට ගෙවනු ලැබූ එකතු කළ අගය මත බදු පිළිබඳ විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස්වරයාට දැනුම් දී නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 290,821 | තැන්පතු 14 ක් වර්ෂ 02 ක් ඉක්ම වූ ඉකුත් තැන්පතු වශයෙන් දක්නට ලැබුණත් එය අදාළ පුද්ගලයින්ට ආපසු ලබාදීමට හෝ ආදායම් ගිණුමට මාරු කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | - | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව විනාශ කළයුතු තොග අයිතමයන් 236 ක් සහ පුස්තකාල පොත් 35 ක් සහ විකිණිය යුතු අයිතමයන් 220 ක් සම්බන්ධයෙන් 2018 සැප්තැම්බර් 21 දින දක්වා කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සමීක්ෂණ මණ්ඩල වාර්තාව පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 683,300 | සභාවේ පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,968,249 ක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,062,954 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,905,295 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම් හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් හා බදු | - | 3 | 3 | - | - | - | - | - |
| (ii) | කුලී | 6,256 | 6,455 | 6,168 | 2,515 | 7,224 | 5,869 | 5,805 | 2,207 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,268 | 2,829 | 2,829 | - | 2,280 | 2,103 | 2,103 | - |
| (iv) | අනෙකුත් ආදායම් | 18,280 | 15,052 | 15,052 | - | 21,826 | 9,693 | 9,693 | - |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2017 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකරගත යුතු ආදායම රු.26,546,915 ක වටිනාකමෙන් සමාලෝචිත වර්ෂයේදී රු.24,053,014 ක් අයකරගෙන තිබුණි. මේ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය 91% ක් වශයෙන් දැක්වුණි.

### 2.2.3 වරිපනම් හා බදු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ප්‍රදේශවල පිහිටි ව්‍යාපාරික ආයතන 656 ක සහ නිවාස 9,983 ක් මත 2003 වර්ෂයේ සිට වරිපනම් තක්සේරු කර අයකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් වාර්ෂිකව ආසන්න වශයෙන් රු.5,319,500 ක ආදායමක් අහිමි වෙමින් පැවතුණි.

(ආ) 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව, සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති සංචාරක බංගලා 117 කින් ලැබෙන ආදායමෙන් සියයට 0.1 ක් බදු ලෙස අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 කුලී අයකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොදු වෙළඳපොලේ කඩ කාමර 33 ක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ හිඟ කඩකුලී රු.562,950 ක් 2018 සැප්තැම්බර් 21 දින වන විටත් අයකර ගැනීමට සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 1992 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා හිඟහිටව පැවැති මස්කඩ බදු මුදල් රු.1,676,663 ක් සහ සමාලෝචිත වර්ෂයට අදාළ මස්කඩ හිඟ බදු රු.95,450 ක් ආදිය අයකර ගැනීමට 2018 සැප්තැම්බර් 21 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශයට අයත් ගම්මානවලට සභාවේ ජල බවුසරය මඟින් නොමිලයේ බොන ජලය ලබාදීම සම්බන්ධයෙන් ජාතික ජල සම්පාදන හා මලාපවාහන මණ්ඩලයට රු.158,623 ක් ගෙවිය යුතු වුවත්, රු.168,461 ක් ගෙවා තිබූ බැවින් රු.9,838 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

(ආ) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ව්‍යාපෘතිවලින් සභාවට ලැබුණු වර්ෂ 02කට අධික කාලයක සිට සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 05ක්, බවුසර එකක් සහ ට්‍රේලර් 03ක් සභාව විසින් භාවිතා කරනු ලබන නමුත් එම වාහනවල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ස්ථාන මාරු වී ගිය සහ සේවය හැර ගිය සේවකයින් 15 දෙනෙකුගේ හිඟ ණය ශේෂ රු.550,726 ක් වූ අතර වර්ෂ 02 ක සිට වර්ෂ 14 කට අධික කාලයක් දක්වා අයකර ගෙන නොතිබුණි. මෙම ණය ශේෂ අදාළ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ ඔවුන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හෝ 2018 සැප්තැම්බර් 21 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) සභා බල ප්‍රදේශයට අයත් සභාව සතු ඉඩම් 46 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාවේ නමට මාරු කරගැනීමට කටයුතු කර නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම්කටයුතුභාවය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 16 ක් සඳහා සලසා තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අවස්ථා 18 කදී රු.1,820,000 ක් ප්‍රතිපාදන මාරු කිරීමට සිදු වීම නිසා අයවැය සැලැස්ම අකාර්යක්ෂම අයුරින් පිළියෙල කර තිබූ බව අනාවරණය විය.

**4.2 නිරවුල් නොකළ විගණන ඡේද**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති අභ්‍යන්තර මාර්ගවලට බොරළු දැමීම සම්බන්ධයෙන් 2016 වර්ෂයේ බොරළු කියුබ් 440 ක් සඳහා රු.1,100,000 ක් ගෙවීම් කර තිබුණි. එසේ වුවත්, තාක්ෂණ නිලධාරී සහ වැඩ අධීක්ෂණ නිලධාරීන්ගේ ලිඛිත සනාථ කිරීම් අනුව බොරළු කියුබ් 297 ක් පමණක් මාර්ගවලට යොදා ඇති බව දන්වා තිබුණි. මේ අනුව, රු.357,500 ක් වටිනා බොරළු කියුබ් 143 ක් සඳහා සභාව විසින් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා සභාවේ සේවය කළ සේවකයින් 04 දෙනෙකුගෙන් වැඩියෙන් අයකරගෙන තිබුණු ණය වාරික රු.48,554 ක් 2018 සැප්තැම්බර් 21 දින වන විටත් ආපසු ගෙවා නිරවුල් කර නොතිබුණි.

(ඇ) සභාවේ ආදායම් වැඩිකිරීම සහ රැකියා අවස්ථා බිහිකිරීමේ අරමුණින් ලෝක දැෂ්‍යා ආයතනයෙන් (World Vision) 2008 වර්ෂයේදී රු.1,231,600 ක මුදලක් සහ 2011 වර්ෂයේ සභාවේ අරමුදල් රු.1,612,127 ක් උපයෝගී කරගෙන කඩදාසි ප්‍රතිචක්‍රීකරණය කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණත් මේ දක්වා එය භාවිතයට ගෙන නොතිබීම හේතුවෙන් විනාශයට පත් වී තිබුණි.

**5. පද්ධති හා පාලන**

පහත දැක්වෙන එක් එක් ක්ෂේත්‍ර හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පාලන ක්ෂේත්‍රය | | විශේෂ අවධානය යොමුකළ යුතු විෂයයන් |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම. |
| | | (ii) | නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | ආදායම් අයකිරීම් කළමනාකරණය | | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කිරීම. |